# බුද්ධෝත්පත්ති දේශය පිළිබඳ නූතන ශ්‍රී ලාංකේය මතවාද හා ගැටලු

කුඩාවැවේ සෝමානන්ද හිමි

## හැඳින්වීම

ක්‍රි. පූ. හයවැනි සියවසෙහි ලොව පහළ වූ සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ජීවන චරිතය හා සම්බන්ධිත උත්තරීතර පූජනීය ස්ථාන හතරක් පිළිබඳ බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙයි. ඒවානම් සිද්ධාර්ථ කුමාරයා උත්පත්තිය ලැබූ සාලවනය, සම්මා සම්බුද්ධත්වය අවබෝධ කරගත් ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිහිටි බුද්ධගයාව, ප්‍රථම ධර්ම දේශනය පැවැත් වූ පුදබිම වූ සාරානාථයේ ඉසිපතන මිගදාය මෙන්ම බුදුරජාණන් වහන්සේ අනුපදිශේෂ මහා පරිණිර්වාණයට පත් වූ කුසිනාරාවෙහි මල්ල රජ දරුවන්ගේ සාලවනය යන පූජනීය ස්ථානයන්ය. ඉහත දැක් වූ පූජ්‍ය ස්ථාන අතුරෙන් පළමුවෙන් සඳහන් කළ පුදබිම වූ ලුම්බිණිය පිහිටා ඇත්තේ හිමාල අඩවියේ පිහිටි නේපාල රාජ්‍යයෙහි වන අතර අනෙක් පුදබිම් තුනම පිහිටා ඇත්තේ පුරාණ දඹදිව හෙවත් වර්තමාන ඉන්දියාවේ බව මීට ශතවර්ෂ ගණනාවක් සිටම පිළිගෙන තිබේ. මේ සම්බන්ධයෙන් පෙරදිග මෙන්ම අපරදිග විද්වතුන් විසින් සිංහල, ඉංග්‍රීසි සහ වෙනත් භාෂාවලින් ලියූ ශාස්ත්‍රීය පොතපත ඉතා විශාල සංඛ්‍යාවක් දැකිය හැකිය. එසේ වුවත් මෑතක සිට බුදුන් වහන්සේ උපන්නේ ශ්‍රී ලංකාවේ යැයි යන මිත්‍යා මතය ප්‍රචාරය කිරීම අසන්නට දකින්නට ලැබේ.

වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ ඉතිහාසයත් බෞද්ධ සංස්කෘතික ඉතිහාසය පිළිබඳවත් විකෘති කිරීම් මෙන්ම වැරදි අර්ථනිරූපණ බොහෝවිට පෙනෙන්නට තිබේ. එහිදී බුද්ධෝත්පත්ති දේශය පිළිබඳ ශ්‍රී ලාංකේය මතවාද බෙහෙවින්ම ගැටලු සහගත බව අවධාරණය කළ යුතුම වෙයි. එම මතවාද

ගෙනහැර පාන්නේ ඓතිහාසික හා ශාස්ත්‍රීය පදනමකින් තොරව බව පැහැදිලිව පෙනෙයි. ඉතා අතලොස්සක් වූ ඇතැම් බෞද්ධයින් යැයි කියා ගන්නා පිරිසක් විසින්ම සිද්ධාර්ථ කුමාරයා උපන්නේ සහ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ජීවිතය හා සම්බන්ධිත දෑ සිදුවූයේ ලංකාවේ යැයි සඳහන් කරයි. ඉන් සිදුවන්නේ පෙරදිග ඉතිහාසයේත් පෙරදිග සංස්කෘතියේත් සුවිශේෂී පුද්ගලයකු වූ ගෞතම බුදුරජාණන් වහන්සේ ඓතිහාසික පුද්ගලයකු නොව මිථ්‍යා චරිතයක් වශයෙන් ප්‍රකට වීමයි.

එහෙත් බුදුරජාණන් වහන්සේගේ උත්පත්ති දේශය පිළිබඳ ඓතිහාසික යථා තත්ත්වය ඉතිහාසඥයින් හා පුරාවිද්‍යාඥයින් විසින් තහවුරු කර තිබේ. ඒ අනුව පුරාවිද්‍යාත්මක ස්ථාන සොයාගැනීම ඔවුනගෙන් සිදුවුණු විශිෂ්ඨ කාර්යයකි. පැරණි ඉතිහාස පොත්පත් සහ චීන සංචාරකයන්ගේ ගමන් වාර්තාවලින් හෙළිවන තොරතුරුත් ක්‍රි. පූ. තෙවැනි සියවසේ දී පමණ අශෝක අධිරාජයා විසින් පිහිටුවා ඇති සෙල්ලිපි පාදක කරගෙන ශ්‍රීමත් ඇලෙක්සැන්ඩර් කනිංහැම් ප්‍රමුඛ කණ්ඩායම විසින් බුද්ධ චරිතය හා සම්බන්ධ වූ ඓතිහාසික ස්ථාන නැවතත් මතු කර ගන්නා ලදි. මුලින් ම සිද්ධාර්ථ කුමාරයා උපන් ස්ථානය වන ලුම්බිණිය සොයාගත්තේ එම කැණීමෙහි ප්‍රතිඵලයක් වශයෙනි. ඒ හැර ගෞතම බුදුන් උපන් ලුම්බිණිය හඳුනා ගැනීමෙහිලා ක්‍රියා කළ වූවන් වශයෙන් ඇලෝසියස් ඒ. පූෂේ, ජේම්ස් ප්‍රින්සෙප්, රීස් ඩේවිඩ්ස්, වින්සන්ට් ස්මිත්, බී. සී. ලෝ, ඩී. ආර්. භාණ්ඩාර්කාර්, කේ. එම්. ශ්‍රීවත්සව, ඩී. එස්. අග්‍රවාල් සහ පී. ඩී. මුඛර්ජී ආදීන් පෙන්වා දිය හැකිය. එසේම ලුම්බිණියේ බෙහෙවින්ම වැදගත් පුරාවිද්‍යා ගවේෂණය සිදු වී ඇත්තේ මෑත කාලයේ දී ය. එනම් 2011 - 2013 අතර කාලයේ දී එංගලන්තයේ ඩරම් විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යාව හා සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය රොබින් කනිංහැම් ප්‍රමුඛ පුරාවිද්‍යාඥයින් විසින් කළ පුරාවිද්‍යා කැණීමය. ඉන් අතිශයින් වැදගත් සොයා ගැනීම් සිදුවිය. එමගින් සිද්ධාර්ථ කුමාරයා ලංකාවේ උපන්නේ යැයි කියන මිථ්‍යාමතයට එරෙහිව ප්‍රබල සාධකයක් අනාවරණය වූ බව මෙහිදී අවධාරණය කළ යුතුය. ඒ අනුව බුද්ධෝත්පත්ති දේශය පිළිබඳ ඇති මිථ්‍යා මතවාදයන්

සඳහා ශාස්ත්‍රීය වූත් ඓතිහාසික වූත් පිළිතුරක් මෙම ලිපියෙන් ලබාදීමට අපේක්ෂිතය.

**භාරතීය භූගෝලීය පරිස්ථිතිය**

කිසියම් රටක ඉතිහාසය හැදෑරීමේ දී එම රටෙහි පිහිටීම මෙන්ම භූගෝලීය පරිස්ථිතිය යන සාධකය සුවිශේෂී වැදගත් ස්ථානයක් හිමිකර ගනියි. ඉපැරණි ඉන්දියානුවන් භාරත වර්ෂ, භාරත දේශ, බ්‍රහ්මවර්ත ආදී විවිධ නම්වලින් හැඳින්විය. මෙම භූගෝලීය කලාපය හැඳින්වීම සඳහා පැරණි ඉන්දියානු ලේඛකයන් භාරත වර්ෂ යන්න භාවිත කළ ද බෞද්ධ සාහිත්‍යයේ ඉන්දියාව හඳුන්වා ඇත්තේ ජම්බුදීප නමිනි. එසේ හඳුන්වා ඇත්තේ දේශපාලනික වශයෙන් වූ එක්සත් බවකට වඩා භූගෙ ා්ලීය වශයෙන් පැවති ඒකීයත්වයක් පදනම් කරගෙනය. බෞද්ධ සාහිත්‍යට ඇතුළත් ජාතක කථාවල සඳහන් බ්‍රහ්මදත්ත වැනි රජවරුන්ගේ රාජ්‍යයන් හැඳින්වීමේදී ද ඓතිහාසික යුගයේ එන අශෝක අධිරාජයාගේ රාජ්‍යය හැඳින්වීමේ දී ද මහාවංසය, දීපවංසය වැනි ශ්‍රී ලාංකික වංසකථා මූලාශ්‍රයයන්හි යොදාගෙන ඇති නාමය වන්නේ ජම්බුද්වීප යන්නයි. බෙංගාලය පාලනය කළ ඇතැම් පාල වංශික රජුන් ස්වකීය පාලන ප්‍රදේශය හැඳින්වීමට යොදාගත් නාමය වන්නේ ද ජම්බුද්වීපය යන්නම ය. එහිදි ඔවුන් එලෙස හැඳින්වූයේ බෙංගාලය යන්නට වඩා මුළු ඉන්දියාවටම යන්නැයි සිතීමට අවකාශ ඇත. මුළු ඉන්දියාවම පර්සියානුවන් විසින් සින්දෝ නමින් ද ග්‍රීක ලේඛකයෝ ඉන්දෝස් නමින් ද හැඳින් වූ අතර ඉන්ඩියා නමින් හැඳින් වූයේ ඉංග්‍රීසීන් විසිනි. වර්තමානයේ භාවිත කරන නාමය වන්නේ ඉන්දියා යනුයි.[1]

භාරත දේශය උතුරින් ඇෆ්ගනිස්ථානය සිට ඇසෑමය තෙක් විහිදෙන සැතපුම් එක්දහස් හයසියයක් පමණ දිගු කඳුවැටිය වන්නේ හිමාලයයි. සින්දු නදී මිටියාවත මෙම කඳුවැටියට දකුණු දෙසින් වයඹටත් බටහිර දෙසටත් යොමුව පිහිටා ඇත. යමුනා, චම්බාල්, ගුම්ති, ගොග්‍රා සහ සෝන යන නදීන්ගෙන් මෙන්ම තවත් කුඩා අතු ගංගා කිහිපයකින් ද ජලය සැපයෙන ගංගා නදී මිටියාවත ද සාරවත් බිම්තීරුවක් වශයෙන් සැලකිය

හැකිය. ඉතාමත් විශාල බිම් ප්‍රදේශයක් වශයෙන් මේ බිම් තීරය පෙන්වා දිය හැකිය. ස්වාභාවික සම්පත් මෙන්ම එකී ප්‍රදේශයන් හරහා ගලා බසින නදීන් හේතු කොටගෙනත් භාරත ඉතිහාසයේ ප්‍රධාන සිද්ධි රාශියක්ම මෙම ප්‍රදේශයෙහි ඉතිහාසගත වී තිබේ. එකී ඓතිහාසික සිද්ධි ලක්දිව දී සිදු වී යැයි කිසිසේත්ම සනාථ කිරීමට නොහැකි වේ.

බුදුන් වහස්සේට සමකාලීනව හෝ ඊට ආසන්න කාලපරිච්ඡේදයේ භාරතයේ තිබූ දේශපාලන බෙදීම් සේ දැක්වෙන රාජ්‍යයන්හි නාමාවලියක් අංගුත්තර නිකායේ ඒකක නිපාතයේ සහ චතුක්ඛ නිපාතයෙහි ද සඳහන් වේ. භූගෝලීය වශයෙන් සැලකීමේ දී මෙම ජනපද දක්ෂිණ භාරතයේ උතුරු සීමාව වශයෙන් සැලකෙන ගෝධාවරී නදිය තෙක් දිවයයි.

**ගෞතම බුදුන් වහන්සේ හා ශ්‍රී ලාංකේය ඉතිහාසය**

ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ සුවිශේෂී ඓතිහාසික අවස්ථාවක් වනු ලබන්නේ, ක්‍රි. පූ. තෙවැනි සියවසේ දේවානම්පියතිස්ස රජුගේ (ක්‍රි. පූ. 250 - 210) අවධියේ දී ශ්‍රී ලංකා ද්වීපයට බුදුසමය නිල වශයෙන් හඳුන්වා දීමය. එය සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවල සටහන්වන ඓතිහාසික සිද්ධියකි. මූලාශ්‍ර පරිශීලනයේ දී බොහෝ සැලකිළිමත්ව ඒවා භාවිතයට ගත යුතුය. මක්නිසාදයත් ''ඉතිහාසඥයාත් ශ්‍රද්ධාවන්තයාත් මේ කථාන්තර දෙස බලන්නේ අරමුණු දෙකකිනි. ඒ අනුව ඔවුන්ගේ නිගමනය ද අසමානය. මේ කථාන්තරවල තම ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි සැබෑ සිද්ධීන් වාර්තා වී ඇත්දැ යි පළමු කී තැනැත්තා සෝදිසි කර බලයි. දෙවැන්නා එය දෙස බලන්නේ එයින් කවර ආධ්‍යාත්මික සත්‍යයක් අනාවරණය වන්නේ දැ යි හා කවර ප්‍රයෝජනයක් තමන්ට එයින් ලබාගත හැකිදැ යි වටහා ගැනීමත්ය.''[2]

බුදු සිරිතෙහි විශේෂ සිදුවීම් රාශියක් අන්තර්ගත ත්‍රිපිටකයේ කිසිදු තැනක හෝ දැනට විද්‍යමානව ඇති ඉන්දියානු හෝ ශ්‍රී ලාංකේය හෝ අනෙක් පාලි ග්‍රන්ථයන්හි ලක්දිව ගෞතම බුදුන් වහන්සේ උපන්නේයැ යි සඳහන් නොවේ. එසේ වුවත් ඊට පෙර බුදුන් වහන්සේ ලක්දිවට තෙවරක් වැඩම කරවන ලද බවක් බෞද්ධ

අට්ඨකථාවල සහ ශ්‍රී ලාංකේය වංසකථාවල පමණක් විශේෂයෙන් සඳහන් කොට ඇති බව පෙනෙයි. මෙම මූලාශ්‍රය පිළිබඳ අදහස් දක්වන ජී. සී. මෙන්ඩිස් පෙන්වා දෙන්නේ ශ්‍රී ලාංකේය වංශකතා නිසැකවම මෙරට දී රචනා කළ බවට පැහැදිලි වුවද පාලි අට්ඨකථා ඉන්දියාවෙහි රචනා කළා ද නැතහොත් ලංකාවෙහි දී රචනා කළා ද යන්න අවිනිශ්චිත බවකි.[3] එනමුදු ඉහත කී මූලාශ්‍රයයන්හි සඳහන් වන්නේ බුදුන් වහන්සේ පළමුවැනි අවස්ථාවෙහි මහියංගනයට වැඩි බවත් දෙවැනිවර උන්වහන්සේ නාගදීපයට වැඩි බවත් තෙවැනිවර කැළණියට වැඩ බුදුන් වහන්සේ සමන්තකූටයෙහි ශ්‍රී පාද ලාංඡනය පිහිට වූ බවත්ය.[4] බුදුන් වහන්සේගේ ලක්දිව වැඩි මෙම ගමන් තුන පිළිබඳව මහාවංසය, දීපවංසය සහ මහාවංසයෙහි ටීකාව වන වංසත්ථප්පකාසිනියේ සඳහන් වෙයි. ශ්‍රී ලාංකේය වංශකථා වාර්තා කොට ඇති පරිදි බුදුන් වහන්සේගේ පළමුවැනි ලංකා ගමනේ දී සිදු වූ සිදුවීම් අතරෙහි එකිනෙකට නොගැලපෙන පරස්පර විරෝධි තැන් කිහිපයක්ම දක්නට ලැබේ.[5] එහෙයින් බුදුන් වහන්සේගේ පළමුවැනි ලංකා ගමනේ දී සිදු වූ සියලු යක්ෂයන් දමනය කිරීම යන පුවතත් බුද්ධ පරිනිර්වාණය සිදු වූ දින ලක්දිවට ගොඩබැස්ස විජය කුමාරයා ඇතුළු පිරිසට සිරිසවත්ථුපරයේ විසූ යක්ෂයන් පිරිසක් ගැන අසන්නට ලැබුණු පුවතක් යන මෙම සිදුවීම් දෙකම හෝ ඒවායින් එකක් හෝ නිසැක වශයෙන්ම සිදු නොවූවකැ යි සැලකිය හැකි බවත් මෙම කථා පුවත් දෙක එකිනෙකින් වෙනස් අවධීන් දෙකක් තුළ දී ප්‍රභවය වූ හෝ සංවර්ධනය වූ හෝ ප්‍රබන්ධ යුගලයක් විය හැකි බවත් මහින්ද සෝමතිලක මහතා පෙන්වා දෙයි.[6] මෙලෙසම පළමුවර බුදුන් වහන්සේගේ මෙම වැඩමවීම හා සම්බන්ධිත පූජා පැවැත්විම, දාගැබ් ඉදිකිරීම වැනි දෑ ද මෙරට වංසකථාවන්හි සඳහන් වී තිබේ.[7] එහෙත් මෙකී සිදුවීම් සම්බන්ධයෙන් පවතින සැක සහිත බව හේතුවෙන් බුදුන් වහන්සේ ලංකාවට වැඩියේ යැයි විශ්වාස කිරීම සහේතුක නොවන බවට සෙනරත් පරණවිතාන පවසා ඇත.[8]

සූත්‍ර පිටකයෙහි තිබෙන සැම සූත්‍රයකම ආරම්භයෙහි ''එවං මෙසුතං එකං සමයං භගවා - සාවත්ථියං විහරති ජේතවනේ

අනාථපිණ්ඩිකස්ස ආරාමේ...'' යනාදි වශයෙන් එකී සූත්‍රයන් කුමන ස්ථානයක දී කවර පිරිසක් සඳහා දෙසුවේදැ යි සඳහන් වේ. එනමුදු මෙම එකදු සූත්‍රයක හෝ ලක්දිව යක්‍ෂයිනට හෝ වෙනත් පිරිසකට හෝ එම සූත්‍ර දේශනා කළ බවක් සඳහන් වී නොමැත.

බුදුන් වහන්සේගේ ලක්දිව ගමන් වාර තුනෙන් අනතුරුව පසුකාලයක දී උන්වහන්සේගේ ඥාති සොහොයුරෙකුයැ යි කියන පණ්ඩු රජුගේ දියණියක් වූ භද්දකච්චානා ඇතුළු කුල ස්ත්‍රීන් දෙතිසක් සමග පරිබ්‍රාජක වේශයෙන් මෙරට ගොඩ බැස්ස බවත් ඇය පණ්ඩුවස් දේව රජුගේ බිසව බවට පත් වූ බවත් පෙනෙයි.[9] පණ්ඩු රජුගේ පියා වන අමිතෝදන ශාක්‍යයන් පිළිබඳව පාලි පිටක ග්‍රන්ථයන්හි කිසිම තොරතුරක් දක්නට නොලැබුන ද පාලි අට්ඨකථාවලත්, මෙරට වංසකථාවලත් පමණක් දැක්වෙයි. එනමුත් ඔහුට සිටි පණ්ඩු ශාක්‍ය නමින් පුතෙකු සිටි බව එම මූලාශ්‍රයයන්හි කිසිදු තොරතුරක් දැකිය හැකි නොවේ.[10] එසේ වුවත් ලක්දිව වංශකථාවන්හි මෙන්ම බෞද්ධ අටුවා ග්‍රන්ථයන්හි ද පණ්ඩු රජුගේ දියණිය වශයෙන් සැලකෙන භද්දකච්චානා කුමරිය බුදුන් වහන්සේගේ පරපුරට පමණක් නොව ඇය මෙරට රාජ පරපුර (පෙළපත) සමඟ ද සම්බන්ධ කොට තිබේ.[11] භද්දකච්චායනා ලංකා වෙරළට පාවී ඒමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇය පඬුවස්දෙව් රජුගේ අගමෙහෙසිය වුවාය. ඉන් අනතුරුව ඇගේ සොහොයුරන් සයදෙනෙකු ද ලක්දිවට පැමිණ විවිධ ප්‍රදේශයන්හි මෙරට ජනපද පිහිටුවාගෙන පදිංචි වූහ.[12] දීඝායු නමැත්තාගේ පුත් ගාමිණී සහ උන්මාද චිත්‍රාගේ සබඳතාවය මත පණ්ඩුකාභයගේ උපත සිදුවිය.

ලක්දිව වංසකථාවන්හි දැක්වෙන පරිදි පණ්ඩුකාභය යනු මව් පාර්ශ්වයෙන් හා පිය පාර්ශ්වයෙන් අමිතෝදන රාජ පරම්පරාවෙන් පැවැත එන හෙයින් ඔහු ශාක්‍ය වංශිකයෙකු පමණක් නොව බුදුන් වහන්සේගේ මී මුණුපුරෙකු වශයෙනුත් බෙහෙවින්ම සම්බන්ධ කොට තිබේ. එමනිසා පණ්ඩුකාභයට ඉතා වැදගත් තැනක් මහාවංසය ලබා දී තිබේ. ඒ අනුව ලක්දිව සිංහාසනය දරන ලද පළමුවැනි ශාක්‍ය වංශික පාලකයා වශයෙන් සැලකිය හැක්කේ පණ්ඩුකාභයයි.[13] එහි විඩූඩභගේ ශාක්‍ය වංශය

විනාශ කිරීම සම්බන්ධයෙන් කිසියම් ඉඟියක් ද අන්තර්ගතය.[14] මෙම කතා පුවතින් හැඟවෙන්නේ පණ්ඩුකාභයගේ මී මුත්තා වන පඬු රජු පමණක් එම විනාශයෙන් නොනැසී ඉතිරි වූ බවකි. එහෙයින් ඉන් පැවසීමට උත්සුක වන්නේ බුදුන් වහන්සේගේ යක්‍ෂ දමනයෙන් පසුව ලක්දිව ජයගත් හෙයින් උන්වහන්සේගේ පරපුරට සම්බන්ධ පඬු රජුගේ පෙළපතට අයත් පණ්ඩුකාභය නීත්‍යානුකූල වශයෙන් එයට හිමිකම් කියන බවකි.[15]

ඉහත සඳහන් කළ පරිදි බුදුන් වහන්සේගේ ලංකා ගමන් හා සම්බන්ධ කතා පුවත්වලින් මෙන්ම පණ්ඩුකාභයගේ පරම්පරාව පිළිබඳ ගෙනහැරපාන විස්තරවලිනුත් මෙරට ජනතාවට දේශපාලනික වශයෙන් වැදගත් පණිවුඩයක් ලබා දෙයි.[16] ඒ අතුරින් ලක්දිව මුල්ම රාජවංශයට මෙරට පාලනය කිරීමට තිබූ උරුමය ප්‍රමුඛයි. එම තත්ත්වය අනුරාධපුර යුගයේ අවසානය තෙක්ම ඔක්කාක රජ පරපුරටත්, ශාක්‍ය වංශයටත් ශ්‍රී ලාංකේය රජ පරපුර සම්බන්ධ කිරීමත්, ශාක්‍ය වංශික රජවරුන්ට සම්බන්ධ කිරීම තුළිනුත් මනාව පැහැදිලි වේ.[17] මේ හැර බුදුන් වහන්සේගේ ශාක්‍ය වංශය නැමැති පෙළපත ස්වකීය පෙළපතට සම්බන්ධයැ යි පස්වැනි මිහිඳු රජුගේ (982-1029) පොළොන්නරුව ටැම් ලිපියේත්, පළමුවැනි වික්‍රමබාහු රජුගේ (1111-1132) මෙහෙසිය වශයෙන් සැලකෙන සුන්දර මහා දේවියගේ දිඹුලාගල මාරාවීදිය සෙල්ලිපියෙන් දැක්වෙයි.[18] මේ තුළින් ගම්‍ය වන්නේ අනුක්‍රමයෙන් ලක්දිව පාලකයින් තමන් බුදුන් වහන්සේගේ පරම්පරාවට සම්බන්ධ වූවන් වශයෙනුත් ඔවුනට මෙරට රජකමට විශේෂ අයිතියක් තිබෙන බව පෙන්වීම උදෙසාත් උත්සහා කර තිබෙන බවයි.[19] පොළොන්නරු යුගයේ සිටි නිශ්ශංකමල්ල ආදීන් ද මෙම අදහස ඉදිරියට ගෙන ගිය බව පෙනෙයි.[20]

මෙවැනි විශ්වාසයක් ලක්දිව වැසියා තුළ මුල් අවධියේ දී සිටම ඇතිවීමට බලපාන ලද්දේ බුදුන් වහන්සේගේ ලංකා ගමන් තුන මත ඇති වුණු මෙරට ධර්මද්වීපයක් හෙවත් නිර්මල බුදු දහම සුරැකෙන දේශයක් වශයෙන් සැලකූ නිසා ය.[21] එනිසාම බුදුන් වහන්සේ මෙහි භාරතයේ සිට වැඩිය බව දීපවංසය, වංසත්ථප්පකාසිනිය වැනි ඉපැරණි මූලාශ්‍රය ග්‍රන්ථයන්හි සඳහන්

වේ.[22] පැරණි ශ්‍රී ලාංකේය වංසකථාවන්හි සඳහන් වී ඇති තවත් කරුණක් වන්නේ විජය ඇතුළු පිරිස ආරක්ෂා කරලීමට උපුල්වන් දෙවියන්ගෙන් විශේෂ ඉල්ලීමක් බුදුන් වහන්සේම කළ බවකි. තව ද මෙරට වංසකතා මඟින් පුරාතන ලංකාවේ දුර බැහැර බෞද්ධාගමික පූජ්‍යස්ථාන තුනක් වන මහියංගන ස්තූපය, නාගදීපයෙහි රාජායතන විහාරය සහ කැලණිය විහාරය යන ඒවා බුදුන් වහන්සේගේ ලංකා ගමන් තුන සමඟ සම්බන්ධ කර තිබේ. දීපවංසයේ සහ මහාවංසයේ තවත් පූජනීය ස්ථාන කිහිපයක් බුදුන් වහන්සේගේ වැඩමවීම බුද්ධ පාදස්පර්ශයට ලක් වූ බව දක්වයි.[23] ඒ අනුව පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර හැර ශ්‍රී ලාංකේය වංසකථා වන දීපවංසය, මහාවංසය වැනි මූලාශ්‍රයවලට අනුව පෙනෙන්නේ ඇතැමෙකු මහින්දාගමනයට පෙර, එනම් බුදුන් වහන්සේගේ ජීවමාන සමයේදී ම මෙන්ම ඊට සමීප පසුකාලීන අවධියේ දී ලක්දිව වැසියා තුළ කිසියම් මනා දැනීමක් බුදුසමය පිළිබඳ තිබූ බවට විශ්වාස කිරීම සඳහා පෙළඹී තිබේ. එහෙත් එවැනි නිගමනයක් කරා යෑමට වෙනත් කිසිඳු මූලාශ්‍රය පාර්ශ්වයක් නොමැත. ඒ අනුව, ශ්‍රී ලාංකේය සංස්කෘතියේ සැබෑ මූලාරම්භය දේවානම්පිය තිස්ස රජුගේ අවධිය තුළ වූ මහින්දාගමනයත් සමඟ මෙරට බුදුසමය ලැබුණු පසු ඇරඹී බව බොහෝ උගතුන්ගේ විශ්වාසය වී පවතියි.[24]

### සිදුහත් කුමරු උපන් භූමිය පිළිබඳ ඓතිහාසික සාධක

දීපවංසය, මහාවංසය යන ශ්‍රී ලාංකේය මූලාශ්‍රයන්හි බුද්ධ පරිනිර්වාණය ක්‍රි. පූ. 543 දී සිදු වූ බව දක්වා ඇත. ඒ අනුව සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේගේ උපත ක්‍රි. පූ. 623 දී සිදු වී තිබේ.25 අසූ වසරක් වූ බුද්ධ චරිතය සම්බන්ධිත තොරතුරු සියල්ලම ත්‍රිපිටකයෙහි සඳහන් නොවූව ද එහි අන්තර්ගත තොරතුරු අනුසාරයෙන් බුද්ධ චරිතය දැන හඳුනාගන්නට හැකිය. බුද්ධ චරිතයේ ප්‍රධාන කරුණු සමුදායක් අන්තර්ගත සූත්‍රයක් වශයෙන් මහාපදාන සූත්‍රය පෙන්වාදිය හැකිය. එහි විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසඳ, කොණාගම, කස්සප යන බුදුවරයාණන් වහන්සේලා ගැන විස්තර ඇතුළත්ව තමන් වහන්සේගේ පියා සුද්ධෝදන ලෙසත්, වැදූ මව මායා දේවිය බවත් රාජධානිය

කපිලවත්ථු බවත් සඳහන් කරයි.[26] උන්වහන්සේගේ උපන් භූමිය කපිලවත්ථු රාජධානිය වශයෙන් එහි සඳහන් වුවද එහි කවර ස්ථානයක දී උපත සිදු වීදැ යි සඳහන් නොකරයි. නමුත් ආදි බෞද්ධ ග්‍රන්ථ අතර ඉපැරණිම කෘතියක් වශයෙන් සැලකෙන සුත්ත නිපාතයේ එය ලුම්බිණියෙහි දී සිදුවූවේයැ යි දැක්වෙයි.[27] ඒ අනුව පෙනීයන්නේ බෝසත් උපත වර්තමාන නේපාල රාජ්‍යයට අයත් ලුම්බිණියෙහි සිදු වූ බවකි. එය බුද්ධ කාලයේ සිට ම සැදැහැවතුන්ගේ අවධානයට ලක් වූ පූජනිය ස්ථානයක් වශයෙන් පැවති බව පෙනෙයි. බෞද්ධ සාහිත්‍යයෙහි සතර සංවේජනීය ස්ථානයන්ගෙන් එකක් වශයෙන් බුදුරජාණන් වහන්සේ උපන් ස්ථානය දැක්වෙයි.[28]

රුම්න්දෙයි ටැම් ලිපියේ සඳහන් වෙන්නේ ප්‍රධාන බෞද්ධ සිද්ධස්ථාන වැඳපුදා ගැනීම උදෙසා ධර්ම යාත්‍රාවේ නියැලි ධර්මාශෝක අධිරාජ්‍යයා ද බුදුන් වහන්සේ උපන් මෙම ස්ථානයට වැඩිය බවත් ලුම්බිණි ග්‍රාමය බද්දෙන් නිදහස් කළ අතර එකළ අයකළ බද්ද අටෙන් එකක් පමණක් බවයි.[29] මෙහැර දිව්‍යාවදානයේ උපගුප්ත නැමැති තෙරවරයාණන් කෙනෙකු අශෝක රජතුමාට ලුම්බිණි වනයට කැඳවා භාග්‍යවතුන් වහන්සේ මේ ස්ථානයෙහි උපන් සේකැ යි දකුණත දිගුකොට පෙන්වූ බව සඳහන් වේ.[30] අශෝක ස්ථම්භය, රුම්න්දෙයි ටැම් ලිපිය මෙන්ම වර්තමානයේ සිදුකොට තිබෙන පුරාවිද්‍යාත්මක කැණීම් සහ ගවේෂණ, ලිඛිත තොරතුරු යනාදි සාධක තුළින් ලුම්බිණිය බුදුන් වහන්සේ උපන් ස්ථානය වශයෙන් නිසැක වශයෙන් ම හඳුනා ගෙන තිබේ. බෝසතාණන් වහන්සේ කෝසල රාජ්‍යයට සම්බන්ධව ශාක්‍ය ජනපදයෙහි සූර්ය වංශයෙහි ශාක්‍ය කුලයට අයත් ක්ෂත්‍රිය පවුලක උපත ලබා ඇත. තවද බෝසත් අවධියේ මෙන්ම බුදුවීමෙන් පසුවත් ගෝතම නමින් ප්‍රසිද්ධ වූ බව පැහැදිලිය.[31]

බුද්ධ චරිතය සහ ශාසන ඉතිහාසය සම්බන්ධිත තවත් වැදගත් සිද්ධියක් වශයෙන් සැලකිය හැක්කේ බරණැස ඉසිපතනාරාමයේ දී පස්වග තවුසනට දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කිරීමයි.[32] බරණැස ඉසිපතනාරාමය බෞද්ධයන්ගේ අවධානය යොමුවන වැදගත් භාරතීය බෞද්ධ පූජනීය ස්ථානයකි.

මෙම ස්ථානය කේන්ද්‍රකොට ගෙන ශාසනික වශයෙන් වැදගත් සිද්ධීන් කීපයක්ම සිදුවී තිබේ. එනම්, බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම වස් සමාදානය, පස්වග තවුසන් පැවිදිවීම හා භික්ෂු ශාසනයේ ආරම්භය මෙන්ම ප්‍රථම පැවිද්ද, ප්‍රථම සෝවාන් හා රහත් භික්ෂූන් ශාසනයේ ඇතිවීම, යසකුල පුතුගේ පැවිද්ද, උපාසක උපාසිකා පිරිස ශාසනයේ ප්‍රථමයෙන් ඇතිවීම, පළමු රහත් සැටනම ධර්ම දේශනා කිරීමට වැඩම කිරීම යන ඒවා ඉන් ප්‍රමුඛ වේ.[33] මහාපරිනිබ්බාන සූත්‍රයේ දැක්වෙන බෞද්ධයන් විසින් දැක බලා වැඳ පුදා සංවේගයක් ඇතිකර ගත යුතු ස්ථාන සතරෙන් එකක් වන්නේ ද පළමු ධර්ම දේශනාව පැවැත් වූ ස්ථානය යි.[34] එමනිසා බරණැස ඉසිපතනාරාමයත් ශාසනික ඉතිහාසය හා සම්බන්ධ ආරම්භක ඓතිහාසික මෙන්ම පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථානයකි.[35] ''ඉසිපතන'' යන ස්ථානය වර්තමානයේ දී ''සාර්නාථය''යනුවෙන් හැඳින්වේ.[36] මෙම ස්ථානයට එම නාමය භාවිතයට ගැනීම සම්බන්ධයෙන් විවිධ අදහස් දක්නට ලැබේ. නිග්‍රෝධමිග ජාතකයේ දැක්වෙන්නේ සාරංගනාථ යන නමින් මුවන්ගේ ප්‍රධානියෙක්ව සිටි බෝසතුන් වහන්සේ හැඳින්වූ බව යි.[37] මෙම නාමය හේතුවෙන් මුවන්ගේ අභය භූමියක් (මිගදාය) වශයෙන් භාවිත කර ඉසිපතනය සාර්නාථය වශයෙන් ව්‍යවහාරයට එන්නට ඇත. සාරංගපාණි යනුවෙන් විරුද නාමයක් වශයෙන් විෂ්ණු දෙවියන් හඳුන්වනු ලැබේ.[38] එහෙයින් කුමන අර්ථයකින් සහ කුමන කාලයක සිට ''සාර්නාථ'' යන්න ව්‍යවහාරයට යොමුවීදැ යි නිශ්චිත වී නොමැත.

නමුත් මෙම ස්ථානයෙන් හමු වූ ක්‍රි. ව. පළමුවැනි සියවසට පසු අභිලේඛන තුළින් පෙනෙන්නේ ද ධර්මචක්‍ර විහාරය, සද්ධර්ම විහාරය, සද්ධර්ම ප්‍රවර්තන විහාරය, සද්ධර්ම ජින විහාරය යනුවෙන් ද ඉසිපතනය හඳුන්වා ඇති බවයි.[39] සාහිත්‍ය මූලාශ්‍රය මත සාර්නාථයේ ඓතිහාසිකත්වය ක්‍රි. පූ. සවැනි සියවස තෙක් වූ ඉපැරණි අවධියට දිවගිය ද පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය තුළින් ඉස්මතුවන සාධක සුලබ නොවේ. එසේවුවත් හගුරන්කෙත ධීරානන්ද හිමියන් පෙන්වා දෙන්නේ ක්‍රි. පූ. තෙවැනි සියවසේ සිට දොළොස්වැනි සියවස දක්වා කාල නිර්ණය කළ හැකි

පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය දැකිය හැකි බවත් එතුළින් සාර්නාථය ගැන අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනැගිය හැකි බවත් ය.[40]

ඒ අනුව මෙම ස්ථානය මෞර්ය පාලක අශෝක අධිරාජ්‍යාගෙ [41] අවධානයට ලක් වූ ස්ථානයක් වන අතර විවිධ කලාකෘතීන්ගෙන්[42] යුක්ත වූ ස්ථානයක් වශයෙනුත් සංඝ සාමග්‍රිය උදෙසා සාමග්‍රි ලිපියක්[43] අශෝකයන් විසින් පළකළ ස්ථානයක් වශයෙනුත් පෙන්වා දිය හැකිය. ඉහත සඳහන් කළ ලේඛනය අශෝක රජුගේ අනුග්‍රහය මත සිදු වූ තෙවැනි ධර්ම සංගායනාවෙන් පසුව පිහිට වන්නට ඇති අතර මෙවැනිම ලිපි දෙකක් සාංචියෙන් ද අලහාබාද් කෞශම්බියෙන් ද හමුවේ.[44]

මේ හැර කුෂාණ යුගයට අයත් ලේඛනයක් හා ගුප්ත යුගයට අයත් සම්මිතිය නිකායන්ගේ ලේඛනයත්,[45] ගුප්ත පාලකයන් කිහිපදෙනෙකු පිහිට වූ අභිලේඛන රාශියක් මෙන් ම පාල වංශිකයන්[46] පිහිටුවන ලද අභිලේඛන ද සොයාගෙන තිබේ. එසේ ම සාර්නාථයට පැමිණි වන්දනාකරුවන්ගේ විවිධ පූජාවන් පිළිබඳවත් සඳහන් අභිලේඛන රාශියක් ද දක්නට ලැබේ.[47] මේ හැර 19 වැනි සියවසින් පසුව කළ පුරාවිද්‍යාත්මක පර්යේෂණ තුළින් විවිධ යුගයන්ට අයත් අභිලේඛන විශාල ප්‍රමාණයක් සොයාගෙන තිබේ.[48]

තවද මෙම ස්ථානය හා සම්බන්ධ පුරාවිද්‍යාත්මක සාධක ක්‍රි. පූ. තෙවැනි සියවසේ සිට දොළොස්වැනි සියවස දක්වාම තිබෙන බව පෙන්වා දිය හැකිය.[49] ඒ අනුව විවිධ අභිලේඛන හා පුරාවිද්‍යාත්මක සාධක ඔස්සේ යමින් ඇතැමෙකු බුදුරජාණන් වහන්සේ සිය පළමුවැනි ධර්ම දේශනය පස්වග තවුසනට දෙසන ලද්දේ මෙම ස්ථානයේ දී බවත් එය අනුස්මරණය කිරීම සඳහා ධම්මෙඛ ස්තූපය ඉදි කළේයැයි ද විශ්වාස කරති.

ධම්මරාජිකා ස්තූපය අසල තිබෙන මූලගන්ධකුටි විහාරය සැලකෙන්නේ බුදුන් වහන්සේ වැඩ සිටිය කුටිය ලෙසත් උන්වහන්සේගේ පළමුවැනි වස් සමාදානය සිදුකළ ස්ථානය ලෙසත් එය සැලකේ.[50] හියුංසියැං විස්තරවලට අනුව ද පසුකල මෙම ගොඩනැගිල්ල විහාරයක් ලෙස භාවිත කළ බවක් පෙනේ.[51]

සාර්නාථය දොළොස්වැනි සියවස දක්වා ම දියුණු බෞද්ධ මධ්‍යස්ථානයක් වශයෙන් පැවති අතර එය ඉන්පසුව එල්ලවුණු විදේශීය ආක්‍රමණයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් පරිහානිය කරා ගමන් කළේය.

බුදුන් වහන්සේගේ උපන් භූමිය පිළිබඳ නිගමනයක් කරා එළඹීමේ දී තත්කාලීන සමාජ පසුබිම අධ්‍යයනය කිරීම ද ඉතාමත් වැදගත් ය. ඒ සඳහා ත්‍රිපිටක සහ අට්ඨකතා ආදී මූලාශ්‍රය බෙහෙවින් ම ප්‍රයෝජනවත්ය. ත්‍රිපිටකයෙහි එන සූත්‍රයන්හි එන සමාජ තොරතුරුත් ශ්‍රී ලාංකේය සමාජයේ ඉපැරණි අවධිය සම්බන්ධයෙන් දැක්වෙන තොරතුරුත් සසඳමින් මේ පිළිබඳව අවබෝධ කරගැනීම වැදගත් වේ. ඒ අනුව, බුදුන් වහන්සේට සමකාලීන සමාජයේ සාමාන්‍යයෙන් බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර වශයෙන් කුල භේදයක් තිබිණි. එසේම පරිබ්‍රාජක, ආජීවක, නිඝණ්ඨ ආදී විවිධ ලබ්ධික තවුස් පිරිස් ද විවිධ ආචාර්ය පරම්පරාවන් ද පැවති බව පැහැදිලිවම පෙනෙයි.[52] බුදුන් වහන්සේ වැඩ සිටි කාල පරිච්ඡේදය තුළ සිටි ඇදුරන් අතර පොක්ඛරසාති, සෝණදණ්ඩ, පොට්ඨපාද, තාරුක්ඛ, චංකී, ජානුස්සොණී, තෝදෙය්‍ය වැන්නන් ප්‍රධාන වේ. එසේ ම බුද්ධකාලය වන විට (ලක්දිව සමාජ පරිසරය තුළ දක්නට නොලැබෙන) සාමයික අදහස් දියුණු තත්වයක තිබිණි. එසේම භාරතීය සමාජය තුළ වේද, බ්‍රාහ්මණ, ආරණ්‍යය මෙන්ම උපනිෂද් ඔස්සේ දියුණු වී පැවතිණි.[53]

කුල භේදය මුල් බැස ගන්නා ලද සමාජ ක්‍රමයක් පවතිනු ලබන්නේ ලක්දිව නොව ඉපැරණි භාරතීය සමාජයේ ය. කුලය මුල්කරගෙන පුද්ගලයාට හිමිවිය යුතු ආර්ථික, සාමාජික මෙන්ම සංස්කෘතික ජීවිතය නිගමනය කිරීම හා සම්බන්ධිත බෞද්ධ මෙන්ම අනෙක් මූලාශ්‍රය සමඟ සැසඳෙන්නේ භාරතයට යි.[54] භාරතීය හා ලක්දිව කුල ක්‍රමය ව්‍යාප්ත වීමේ ස්වරූපය පිළිබඳ අවධානය යොමු කිරීමේදී මේ පිළිබඳ හොඳින් ම වටහාගත හැකිය. භාරතීය සමාජයෙහි කුල භේදය තහවුරු වූ අයුරු දීඝනිකායේ පාථික වර්ගයේ අග්ගඤ්ඤ සූත්‍රය වැනි සූත්‍ර තුළින් ප්‍රකට වේ.[55]

එමෙන්ම බුදුන් වහන්සේ ජන්ම ලාභය ලැබූ භාරතයේ වූ විෂම සමාජ පසුතලය ලක්දිව සමඟ කිසිසේත් ම නොසැස දෙයි. වර්ණාශ්‍රම ධර්ම පදනම් කරගන්නා ලද බමුණු මතවාද තුළින් සමස්ත සමාජයම සංවිධානය වී පැවතියා පමණක් නොව මිනිස් නිදහස මෙන්ම අයිතිය ද සියලුදෙනාට සමව හිමි නොවුනේ ලක්දිව නොව භාරතයේ ය. එහෙත් මෙම සමාජ සංවිධානය පිළිබඳ තොරතුරු සැසඳෙන්නේ භාරතයත් සමඟ බව ඉතාමත් පැහැදිලි ය.

## තෙවැනි ධර්මසංගායනාව සහ ධර්මදූත ව්‍යාපාරය

සාහිත්‍ය මූලාශ්‍රයවලට අනුව බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරුව තෙමසක් සහ සියවසක් ගිය පසු පැවැත් වූ පළමු සහ දෙවැනි ධර්ම සංගායනා තුළින් ශාසනයේ චිරපැවැත්ම උදෙසා ක්‍රියාකළ බව සනාථ වේ.[56] ඉන්පසු තෙවැනි සංගායනාව බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙසිය දහඅටක් ගිය පසු ධර්මයේ මෙන්ම ශාසනයේ චිරපැවැත්ම සඳහා ගන්නා ලද කාලෝචිත ක්‍රියාමාර්ගයකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් බුදුදහම ඉන්දියාවේ ම ප්‍රත්‍යන්ත ප්‍රදේශයන් සඳහාත් ඉන්දියාවෙන් පරිබාහිර ප්‍රදේශයන් වන ලක්දිව, ස්වර්ණභූමිය හා යවනය වැනි ප්‍රදේශවලටත් මොග්ගලීපුත්තතිස්ස හිමියන්ගේත් මෞර්ය පාලක අශෝකයන්ගේත් ක්‍රියාමාර්ග තුළින් පතුරුවා හරින ලදි.[57] මෙම තෙවැනි ධර්මසංගායනාව සහ ධර්මදූත ව්‍යාපාරය පිළිබඳ ශ්‍රී ලාංකේය පාලි මූලාශ්‍රය ග්‍රන්ථයන් වන දීපවංසය, මහාවංසය, සමන්තපාසාදිකාව යන වංසකථා හා අට්ඨකථාවේ පූර්ණ විස්තරයක් දැකිය හැකිය.[58]

එනමුත් දිව්‍යාවදාන වැනි ඉන්දීය සාහිත්‍ය මූලාශ්‍රයයන්හි මේ පිළිබඳ තොරතුරු ඇතුළත් වන්නේ සීමිතවයි. මෞර්ය අධිරාජ්‍යය අශෝකයන් සිය දික්විජය ප්‍රතිපත්තිය යටතේ ස්වකීය ආධිපත්‍යය ඉන්දියාවේ විශාල භූමි ප්‍රදේශයක ව්‍යාප්ත කළ අතර ඔහුගේ කාලිංග යුද්ධයෙන් අනතුරුව ධර්මවිජයේ ඇති වටිනාකම පිළිබඳව ඔහුගේ දිල්ලි තෝප්‍රා, ගිරිනාර් ආදී ලිපිවල දක්නට ලැබේ.[59] සසුන තුළ මිසදිටු අදහස් ව්‍යාප්ත කිරීමට දැරූ

ප්‍රයත්නයන් වළකාලීම සඳහා තෙවැනි සංගායනාව කිරීම සඳහා අශෝකයන් අනුග්‍රහය දැක්වූ බව වංසත්ථප්පකාසිනී ආදී මූලාශ්‍රය ද සනාථ කරයි.[60]

ඉහත සඳහන් කළ ශ්‍රී ලාංකේය වංසකථා මූලාශ්‍රයයන්හි දැක්වෙන මේ හා සම්බන්ධ තොරතුරුවල විශ්වසනීයභාවය තහවුරු කිරීමෙහි දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන්හි සහය ලබාගැනීම ඉතාමත් වැදගත් ය. අශෝක හා අශෝකයන්ගේ අභිලේඛන පිළිබඳව අධ්‍යයන කළ ඇතැම් උගත්හු ඔහු බෞද්ධයකු නොවන බවත්[61] ඇතැම්හු ඔහු බෞද්ධයකු බවත් පෙන්වාදීමට උත්සහා දරා තිබේ.[62] අශෝකයන්ගේ සිය අභිලේඛන වයඹදිග ඉන්දියාවේ කන්දහාර් ප්‍රදේශයේ සිට නැගෙනහිරින් ඔරිස්සාවේ ධෞලි හා ජෞගඩපූර් දක්වාත්, කල්සි, ලුම්බිණි වැනි හිමාල පාමුල ප්‍රදේශයේ සිට දකුණේ මස්කී, බ්‍රහ්මගිරි වැනි ප්‍රදේශ තෙක් ද විසිරී පවතින බව ප්‍රකටව තිබේ. මෙකී අභිලේඛනවල තෙවැනි සංගායනාව ගැන කිසිදු සඳහනක් නොමැති නිසා ඇතැමෙක් මේ පිළිබඳව සැක පහළ කරති. නමුත් අභිලේඛනවල අන්තර්ගත තොරතුරු තුළින් තෙවැනි සංගායනාව සම්බන්ධව යම් යම් සාධක අනාවරණය කර ගැනීමට හැකි බව ධීරානන්ද හිමියෝ පවසති.[63]

තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙන් එන ප්‍රධාන කාර්යය වන්නේ ඉන්දියාවේ ප්‍රත්‍යන්ත ප්‍රදේශයන්හි ද ඉන්දියාවෙන් බැහැර ප්‍රදේශයන්හි ද බුදුදහම ව්‍යාප්ත වීමය. ඒ පිළිබඳ දක්නට ලැබෙන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අධ්‍යයනය කිරීම තුළින් ද තෙවැනි සංගායනාව පිළිබඳව තොරතුරු අනාවරණය කරගත හැකිය. මෙකී ධර්මදූත ව්‍යාපාරය සම්බන්ධයෙන් වංශකථා තුළත් විනය අටුවාවේත් සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් වේ.[64] ඒ අනුව මොග්ගලීපුත්ත තිස්ස හිමියන්ගේ ඓතිහාසිකත්වය සාංචියේ වූ එක් ධාතු මඤ්ජුසාවක පත්ලෙහි ''සපුරිස මොගලිපුතස''යනුවෙන් සඳහන් පාඨය තුළින් සනාථ කරගත හැකිය.[65] තවද සාහිත්‍ය මූලාශ්‍රගතව එන මෙම ධර්මදූත ව්‍යාපාරය පිළිබඳ සාධක සඳහා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය තුළින් ද සාක්ෂි ලැබෙන්නේ නම් තෙවැනි සංගායනාවේ ඓතිහාසිකත්වය තවදුරටත් සනාථ වේ. ඒ අනුව වංශකථාවලත්

සමන්තපාසාදිකාවෙත් ධර්මදූත කණ්ඩායම් නවයක් පමණ නායකත්වය දැරූ භික්ෂුවකගේ ප්‍රධානත්වයෙන් විවිධ ප්‍රදේශවලට යැවූ බවත් ශ්‍රී ලංකාවට මහින්ද තෙරුන් ප්‍රමුඛ භික්ෂූන් පස්නමක් යැවූ බවත් සඳහන් වේ.[66] සාහිත්‍යාගත මූලාශ්‍රයයන්හි දැක්වෙන ධර්මදූත ක්‍රියාවලියට සම්බන්ධ අරහන්ත කස්සපගොත්ත ආදී තෙරවරුන්ගේ නාමයන් අභිලේඛන තුළින් සනාථ වී තිබීමෙන් ඔවුනගේ ඓතිහාසිකත්වයත් තෙවැනි සංගායනාවේ නිරවද්‍ය බවත් හඳුනා ගැනීමට බාධා ඇති නොවේ.[67]

මහින්දාගමනය ශ්‍රී ලාංකේය ඉතිහාසයෙහි ඉතාමත් වැදගත් සංධිස්ථානයක් වශයෙන් සැලකිය හැකි බව අවිවාදිත ය. එහෙයින් ම, එය මෙරට සංස්කෘතියෙහි සමාරම්භය වශයෙන් ද ඇතැම්හු සලකති. එමඟින් බුදුදහම මෙන්ම මෙරටට නව සංස්කෘතියක් ද ලැබිණි. එතුළින් ලක්දිව ලැබූ විශිෂ්ට දායාදයන් වන්නේ වෙහෙරවිහාර ඉදිකරවීම, ශ්‍රී මහාබෝධිය රෝපණය කිරීම, කලාව හා ගෘහනිර්මාණ ශිල්පය ඇතිකරවීම, සාහිත්‍ය අංශයේ ප්‍රබෝධය ආදිය යි. මහින්ද තෙරුන් වහන්සේ ත්‍රිපිටක හා අට්ඨකථා ලක්දිවට රැගෙනවිත් මෙරට වාසීන්ගේ ධර්මාවබෝධය සඳහා සිංහල භාෂාවට පරිවර්තනය කළ බව ද සඳහන් වේ.[68] ඒ අනුව මහින්දාගමනය සිදු වූ දිනය යනු සිංහල සංස්කෘතියේත් ශ්‍රී ලාංකේය බුද්ධ ශාසනයේත් සමාරම්භක දිනය වශයෙන් සැලකීම සකාරණ වේ. මෙරට ඉතිහාසයෙහි සන්ධිස්ථානයක් වශයෙන් සැලකෙන මහින්දාගමනයේත් ඒ සඳහා පසුබිම සැකසුණු මෞර්ය පාලක අශෝක අධිරාජ්‍යයාගේ ඓතිහාසිකත්වය පුරාවිද්‍යාත්මක සාක්ෂි තුළින් සනාථ වීම ඉතාමත් වැදගත් වෙනවා මෙන් ම එහි නිරවද්‍යතාව පැහැදිලිව ම සනාථ කරගැනීමට හේතුවක් ද වේ.

ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශයට අයත් සාංචියේ දෙවන ස්තූපයේත් සෝනාරි සහ ආන්ද්‍රේ ස්තූපයන්හිත් කරන ලද කැණීම් තුළින් හමු වූ ධාතු මඤ්ජුසාවල තිබෙන ලේඛනත්[69] මෙරට රජගලින් සහ මිහින්තලයෙන් ලැබුණු අභිලේඛන සාධකත් සංසන්දනය කොට අධ්‍යයනය කිරීමෙන් පුරාවිද්‍යාත්මකව මෙය තහවුරු කරගැනීමට හැකි වේ.

ඒ අනුව සාංචිය අවට ප්‍රදේශය මෞර්යයන්ගේ බෞද්ධාග

මික කාර්යභාරයේ සුවිශේෂ ප්‍රදේශයක් වශයෙන් සර් ජෝන් මාර්ෂල්, ඇලෙක්සැන්ඩර් කනිංහැම් වැන්නන්ගේ පර්යේෂණ මත පුරාවිද්‍යාත්මකව සාක්ෂි සොයාගැනීම තුළින් සනාථ වේ.[70] සාංචිය බෞද්ධ සිද්ධස්ථානයක් වශයෙන් බොහෝ කාලයක් වර්ධනය වූ බවත්, මුල් කල එය මිහිඳු හිමියන්ගේත් එම ඥාතින්ගේත් අනුග්‍රහයට ලක් වූ තැනක් වන අතර අශෝකයන්ගේ ධර්මදූත ව්‍යාපාරය සම්බන්ධ පැහැදිලි පුරාවිද්‍යාත්මක සාක්ෂි හමුවන ස්ථානයක් වශයෙන් ද පෙන්වා දිය හැකිය.[71]

### මායාදේවී විහාරයේ ඓතිහාසික ගවේෂණය

බුදුන් උපන් දේශය පිළිබඳ ඉතාම වැදගත් තොරතුරු රාශියක් සොයාගෙන තිබේ. එංගලන්තයේ ඩරම් විශ්වවිද්‍යාලයේ රොබින් කොනිංහැම් සහ පුරාවිද්‍යාඥ කොෂ් ප්‍රසාද් යන දෙදෙනාගේ මූලිකත්වයෙන් වර්ෂ 2013 දී කළ පුරාවිද්‍යා කැණීම් ව්‍යාපෘතියක් මෙහෙයවන ලදි. ඉන් හමු වූ පුරාවිද්‍යා දත්තයන් ලුම්බිණි සල් උයනේම තිබුණු මහාමායා විහාර පරිශ්‍රයේ 2011 සිට කළ කැණීම් මාලාවෙහි ප්‍රතිඵලයකි. මේ පිළිබඳව ඉතා වැදගත් සහ නිශ්චිත තොරතුරු රාශියක් ඉහත පර්යේෂණයෙන් අනාවරණය කර ගැනීමට හැකිවිය.[72] එහිදි අශෝක රජතුමා විසින් පිහිටුවන ලැබූ ශිලා ටැඹත් ක්‍රි. ව. 5 වැනි සියවසේ හා ක්‍රි. ව. 7 වැනි සියවසේ දී මෙම පුදබිමට පැමිණි චීන ජාතික භික්ෂූන් වූ ෆාහියන් හිමියන්ගේ හා හියුංසාං හිමියන්ගේ ද වාර්තා යොදාගෙන තිබිණි. ඔවුන් දෙදෙනා ම මායාදේවි විහාරයත් අසෝක රජු විසින් පිහිටුවන ලැබූ ටැම් ලිපිය ගැනත්, ශිලාටැඹ ගැනත් සඳහන් කර තිබේ.

රොබින් කොනිංහැම් ප්‍රමුඛ පුරාවිද්‍යාඥයන් විසින් 2013 ලුම්බිණි පරිශ්‍රයේ දී කළ කැණීමට පෙර මෙහි කැණීම් කර ඇත. ඒ අනුව එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය ( UNESCO) (යුනෙස්කෝව) විසින් ලුම්බිණි පුදබිම 1997 දී ලෝක උරුමයක් බවට පත් කළ අතර 1979 දී පමණ නේපාල රජය විසින් ලුම්බිණි වර්ෂය නමින් ද නම්කොට ඇත. එම කැණීම් පිළිබඳවත් සංවර්ධන කටයුතු පිළිබඳවත් සවිස්තරාත්මක තොරතුරු එම වාර්තාවල දැකිය හැක.[73]

1970- 1971 වර්ෂයන්හි දී ලුම්බිණි පුදබිමෙහි අශෝක ස්ථම්භය සහ මායාදේවි විහාරය අතර ප්‍රදේශය පුරාවිද්‍යා කැණීමකට ලක් කර තිබේ. එම කැණීමෙන් බුද්ධ කාලයට පෙර හා ඊට පසු කාලයේ මෙහි ජනාවාස පැවැති බවට සාක්ෂි අනාවරණය විය. අශෝක රජුගේ ටැම් ලිපිය පිහිටි උයන් පරිශ්‍රයයේ දකුණු පෙදෙසේ තිබෙන භූමිය කැණීමේ දී රොබින් කනිංහැම් විසින් කාල නිර්ණය කළ අන්දමින් ම උක්ත පුරාවස්තු අයත් වන්නාවූ ක්‍රි. පූ. 6 වැනි සියවසට අයත් වන දත්ත සොයා ගැනීමට හැකි වී තිබේ. එම කැණීමෙන් ක්‍රි. පූ. 6 වැනි සියවසේ සිට ගුප්ත යුගයේ ක්‍රි. ව. 5-6 වැනි සියවස්වලට අදාළ පුරාවිද්‍යාත්මක සාධක ද සොයාගෙන තිබේ. අසාර්ථක කැණීමක් වුවත් මීට පෙර ද 1933 - 39 කාලයේ දී ලුම්බිණි පුදබිමෙහි කැණීම් කළ බවට වාර්තා වෙයි.[74] මායාදේවී විහාරයට අයත්ව පැවැති මෙකී පුරාවිද්‍යාත්මක දත්ත අනුසාරයෙන් සල් වෘක්ෂයේ කොටස් ක්‍රි. පූ. 550 අයත් වන්නේයැ යි පුරාවිද්‍යා කාලනිර්ණ වාර්තාවලින් සනාථ වී තිබේ. ලන්ඩන් විශ්වවිද්‍යාලයේ දකුණු ආසියානු පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ පුරාවිද්‍යා කථිකාචාර්ය ජූලියා ෂෝ පවසන්නේ මායා විහාරය, සල්ගස බුද්ධ කාලයට පෙර සිට ම මෙහි ජනතාවගේ පුදපූජාවලට ලක් වූ බවකි. මායාදේවී විහාරයේ කැණීම් පිළිබඳව රොබින් කොනිංහැම් පවසන තවත් වැදගත් කාරණයක් වන්නේ මෙම පුදබිමෙහි සත්ව ඝාතනය හෝ බිලි පූජාවන් ආදිය සිදුකර නොමැති බවයි. ඒ අනුව මෙම ස්ථානය වැඳුම් පිදුම් කළ ගෞරව කළ පුදබිමක් ව තිබූ බව සැළකිය හැකිය.

**සමාලෝචනය**

රටක ඉතිහාසය, සංස්කෘතික උරුමය, පුරාවිද්‍යාත්මක ස්ථාන ආදිය සුවිශේෂි වැදගත් කමක් දරයි. මක්නිසාදයත් මේවා අත්‍යන්තයෙන්ම භූමිය පිළිබඳ අයිතිය මෙන් ම ජාතික අනන්‍යතාව යන සංකල්ප සමග බැදී තිබෙන හෙයිනි. ශ්‍රී ලංකාවේ ඉතිහාසය, සංස්කෘතික උරුමය වැනි දෑ මෑත කාලයේ සිට ස්වකීය පටු අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා යොදාග න්නා බව පෙනීයයි. ඕනෑම රටක පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන් සුවිශේෂි වැදගත් කමක් උසුලයි. එබැවින් එම පුරාවිද්‍යාත්මක

ස්ථාන මෙන්ම ස්මාරක ආදිය විනාශ කිරීම තත් ජනතාවගේ සිතුම් පැතුම් සහ ජනවිඥානය වෙනස් කිරීම තුළින් එම රටේ ඉතිහාසය හා සංස්කෘතික ක්ෂේත්‍රයන්ට බොහෝ බලපෑමක් එල්ල කිරීමට හැකියාවත් විවෘත කරනු ලබයි. එපමණක් නොව විකෘතියට ලක්වීම ද සිදුවෙයි. ඒ අයුරින් ජනතාවගේ විශ්වාසයන්ට මෙන්ම හරපද්ධතීන් වෙනස් කිරීම තුළින් විශාල හානියක් කිරීමට ද අවකාශ සැලසේ. එමනිසා ස්වකීය මව්බිම සහ සංස්කෘතිය සම්බන්ධයෙන් ඔවුන් තුළ පවතින විශ්වාසය හා පිළිගැනීම සිත් තුළින් පහව ගිය කළ පුරාවිද්‍යාත්මක නෂ්ටාවශේෂ හෝ උරුමයන් පැවතීමෙන් පලක් නොවනු ඇත. එහෙයින් රටක ඉතිහාසය, සංස්කෘතික විශ්වාස හා හරපද්ධතීන් තදනුබද්ධ විකෘති කිරීම සංස්කෘතිය පිළිබඳ විශ්වාසය පළුදු වීමට බෙහෙවින්ම උපකාරී වේ. එවැනි විකෘති කිරීමක් වශයෙන් හා හානිදායක මතයක් ද ඉදිරිපත් කිරීමක් වශයෙනුත් "බුදුන් වහන්සේ උපන් දේශය උත්තර භාරතය නොව ශ්‍රී ලංකාවය" යන්න පෙන්වා දිය හැකිය. එසේ ම එය ශ්‍රී ලංකාවේ ඉතිහාසය වැරදි ලෙස අර්ථනිරූපනය කිරීමකි. එබැවින් උක්ත කාරණා පදනම් කර ගෙන බුදුරජාණන් වහන්සේගේ උප්පත්තිය සිදුවූයේ ජම්බුද්වීපයේ (ඉන්දියාව) මිස ශ්‍රී ලංකාවේ නොවේය යන්න සකාරණව සනාථ වන බව පැහැදිලිව සඳහන් කළ හැකිය.

## ආන්තික සටහන්

1. *ඉන්දියාවේ ඉතිහාසය*, සංස්. අධ්‍යාපන ප්‍රකාශන දේපාර්තමේන්තුව, 2004, 1-2 පිටු.
2. මහින්ද සෝමතිලක, *ශ්‍රී ලාංකේය බෞද්ධ ශාසනයෙහි සමාරම්භය*, සී/ස. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම, 2014, iං පි.
3. ජී. සී. මෙන්ඩිස්, *ලංකා ඉතිහාසයේ ගැටලු*, පරි. නීල් ශ්‍රී විජයසිංහ, ඇපොතිකරීස් සමාගම, කොළඹ, 1966, 85 පි.
4. *උභයපූරණ සහිතො මහාවංසො*, සංස්. ඒ. පී. බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959, 1 පරි. 9-17 ගාථා.
5. සෝමතිලක, 2014, *මහාවංස* පි.
6. *එම.*
7. *උභපූම*, 1 පරි. 33 -38 ගාථා.
8. ලෙස්ලි ගුණවර්ධන, ''බුදුන්වහන්සේගේ නෑදෑයෝ: ලංකාවේ පුරාණ හා

මුල් මධ්‍යතන යුගයේ දේශපාලන වරම හා මිත්‍යා කථා'', *යාත්‍රා*, සංස්. රංජිනි ඔබේසේකර සහ තවත් අය, ලංකා සමාජ ගවේශණ සංගමය, 1987 අප්‍රේල්, 1 කලාපය, 28 පි.
9. *ඌපුම*, 1 පරි. 19-25 ගාථා.
10. මෙන්ඩිස්, එම, 1966, 80 පි.
11. R.A.L.H. Gunawardana, "The kinsmen of the Buddha: Myths as political charter in the ancient and Mediaeval kingdoms of Sri Lanka", Sri Lanka Journal of the Humanities, Vol. II, No. 1, 1976, 53-62 pp.
12. *ඌපුම*, 8 පරි. 18-19 හා 27 ගාථා.
13. සෝමතිලක, එම, 2014, xiv පි.
14. G. P. Malalasekara, *Dictionary of Pali Proper names*, Pali Text Society, London, Vol. II, 1960, 171, 857 pp.
15. සෝමතිලක, එම, 2014, xiv පි.
16. එම.
17. පස්වැනි කාශ්‍යප රජු (914-923), මැදිරිගිරිය ටැම් ලිපිය, D. M. De Z. Wickramasinghe, *Epigraphia Zeylanica*, (EZ.) Asian Educational Services, New Delhi, Vol. II, 1994, 25-33 pp; ඌපුම, 2 පරි.; S. Paranavitana,"Kataragama Inscriptions"; Epigraphic Zeylanica, ed. D. M. De Z. Wickramasinghe and H. W. Codrington, Asian Educational Services, New Delhi, Vol. III, 1994, 222, 223 වචත හතර වැනි මිහිඳු රජුගේ (956 - 972) අභයගිරියෙහි සෙල්ලිපියක; S. Paranavitana, "A Fragmentary Slab Inscription found at the Buddhist railing near the eastern dagaba, Anuradhapura", EZ., Vol.III, 1994, 226-229 pp.
18. *EZ.*Vol. II, 1994, 194-202 pp.
19. සෝමතිලක, එම, 2014, ංඩස පි.
20. මහින්ද සෝමතිලක, *නිශ්ශංකමල්ල අනුශාසනා හෙවත් පොළොන්නරුවේ ශිලා ලේඛන*, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2009.
21. සෝමතිලක, එම, 2014, xvii පි.
22. *දීපවංසය*, සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, ගුණසේන සමාගම, කොළඹ, 1980, 1 පරි. 17 - 27 ගාථා; *Vamsattappakasini*, ed. G. P. Malalasekara, Pali Text Society, Vol. I, 1935, 66 – 69 pp.
23. *දීපවංසය* 1, හා 2 පරි., මහාවංසය 1 පරි.; සෝමතිලක, 2014, xviii පි.
24. සෝමතිලක, 2014, ංං පි.
25. *මනි. 1*, මහාසීහනාද සුත්ත, 196 පි., දී. නි. 2 මහාපරිනිබ්බාන සුත්ත, 238 පි.
26. *දීනි. 2* මහාපදාන සුත්ත, 10 පි.

27. ''අසම උතුම් රත්නයක් වැනි ඒ බෝසතාණෝ මිනිස්ලොව හිතසුව පිණිස ශාක්‍ය ජනපදයෙහි ලුම්බිණි ග්‍රාමයෙහි උපන්හ.''සුනි. මහාවගග, නාලකසුත්ත , 214 පි.
28. *අංනි 2*, චතුකක, කෙසීවග්ග - සංවෙජනීය සුත්ත, 232 පි.
29. *Corpus Inscriptionum Indicarum*, Vol.I (1924) 164 p.
30. *Divyavadana*, by E. B. Coweland R.A. Neli, Cambridge 1866, 389 p.
31. කොල්ලුපිටියේ මහින්ද සඬසරක්ඛිත හිමි සහ කීර්ති නාරම්පනාව, *බුදුන් වදාළ බුද්ධ චරිතය*, බත්තරමුල්ල, සමීර ප්‍රකාශන, 2006, 33 පි.
32. *මහාවග්ගපාලි*, සංස්. අම්බලන්තොට ධම්මකුසල හිමි, කොළඹ: රාජ්‍ය මුද්‍රණාලය, 1957, 16, 19 පිටු.
33. හඟුරන්කෙත ධීරානන්ද හිමි, *පුරාතන ශ්‍රී ලාංකේය සංඝ සංවිධානය සහ එහි ව්‍යුහාත්මක පදනම*, වරකාපොඃ ආරිය ප්‍රකාශකයෝ, 2005, 10 පි.
34. *දීඝනිකාය,* සංස්. ලබුගම ලංකානන්‍ද හිමි, කොළඹ, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1976, 218, 219 පිටු.
35. ධීරානන්ද හිමි, එම, 2005, 10 පි.
36. Debala Mitra, *Buddhist Monuments*, Calcutta: sahitya samsad, 1971, 66 p.
37. *ජාතකට්ඨකථා*, සංස්. විදුරුපොළ පියදස්සි හිමි, ත්‍රිපිටක මුද්‍රණාලය, කොළඹ, 1928, 139-140 පිටු.
38. *Corpus Inscriptionum Indicorum* (CII) Vol. III, ed. J. F. Fleet, Calcutta: Government Press.
39. *Ibid.* 281–292 pp; Daya Ram Sahni, Catalogue of the Museum of Archaeology Sarnath, Calcutta: Government Press, 1914, 208, 2010, 211 pp.
40. ධීරානන්ද හිමි, එම, 2005, 11 පි.
41. Mitra, op.cit, 1971, 66 p.
42. Ibid.
43. CII, Vol. I, 1928, 30 p.
44. Ibid, 22-23pp.
45. D.C. Sirca, S*elected Inscriptions*, Vol. I, Delhi: Asian Humanities Press, 1986, 136 p.
46. CII, Vol. III, 1888, 147,183 pp; Sirca, Op.cit,1986, 136,328, 331 pp ; Selected Inscriptions, Vol. II, 1983, 293, 312 pp.
47. Sahni, op.cit, 1914, 208 – 250 pp.
48. D. Revata, Sarnath, Varanasi: 1928, 23 – 24 pp.
49. Mitra, op.cit, 1971, 67-69 pp.; B. Majumdar, A Guide to Sarnath, Delhi: The Manager Publications, 1947, 20 – 25 pp; Majumder, op.cit, 1947, 7 p; Guide to the Buddhist Ruins of Sarnath, Simla:

Government press, 1923, 6 – 38 pp.; Alexandar Cunningham, Archaelogical Survey of India, Delhi: Indological Book House, 1972, 104 – 105 pp. ධීරානන්ද හිමි, එම, 2005, 12-21 පිටු.

50. ධීරානන්ද හිමි, එම, 2005, 13 පි.
51. *හියුං සියැං භ්‍රමණ වෘතාන්තය*, පරි. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, කොළඹ: අනුලා මුද්‍රණාලය, 1961, 200 පි.
52. *අංගුත්තර චතුක්ක*, 4. 1. 14 - 6, ද්‍රෝණ සුත්ත.
53. රද්දැල්ලේ පඤ්ඤාලෝක හිමි, *බුදුරජාණන් වහන්සේ හා බ්‍රාහ්මණ සමාජය*, කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම, 1984, 18 පි.
54. *සු.නි.* උරගවග්ග, වසල සූත්‍රය, 136 ගාථාව; අ.නි. අට්ඨක නිපාත මහාවග්ග, 8. 1. 2. 9. පහරාද සූත්‍රය, 88 පි.
55. අග්ගඤ්ඤ, දී.නි.
56. දීප, පරි. 9, ගාථාග 21ල 22ල 30 - 31ල 38; ඌපුම, 1959, පරි. 6, ගාථා. 47, 71, 74; සමන්ත, සංස්. යු. එස්. එස්. ධම්මකිත්ති හිමි, කොළඹ: ග්‍රන්ථාලෝක යන්ත්‍රාලය, 1900, 13-17 පිටු.
57. දීප. පරි. 8; ඌපුම, පරි. 12; සමන්ත, 25-27 පිටු.
58. දීප. පරි. 6-7; ඌපුම, පරි. 5-2; සමන්ත, 26-29 පිටු.
59. *Corpus Inscriptionum Indicarum* (CII), ed. E. Hultzsch, Delhi: Archaeological Servey of the India, 1991, (reprint) 45 p.
60. දීප. පරි. 7, ගාථා. 34-38; ඌපුම පරි. 5 ගා. 228 - 229; සමන්ත, පි. 24. *Vamsatthappakasini* (vap.), Vol. I ed. G. P. Malalasekara, London: PTS, 1935, 288 p.
61. H. Heras, "Asoka Dhamma and Religious", Qurterly Journal of the Mythic Society, Vol. XVII, 1927, 255- 276 pp.
62. H. H. Wilson, "on the Rock Inscription of Kapurdigiri Dhauli and Girinar", Journal of Royal Asiatic Society, (JRAS), Vol. XII, 1848, 234-256 චචත ධීරානන්ද හිමි, එම, 37 පි.
63. ධීරානන්ද හිමි, එම, 2005, 37-41 පිටු.
64. දීප. පරි. 8, 4 - 12 ගාථා; ඌපුම, පරි. 12, 1-10 ගාථා; සමන්ත, 29 පි.
65. Alexandar Cunningham, *The Bhilsa Topes: or Buddhist Monuments of Central India*, Varanasi: Indiological Book House, 1966, 190 p.
66. දීප. පරි. 8, 4-12ගාථා; ඌපුම, පරි. 12, 3 - 10 ගාථා; සමන්ත, 29 පි.
67. Cunningham, op.cit, 1966, 189 p.; Ibid, 189-191 pp.
68. *පපඤ්චසූදනී, මජ්ඣිම නිකායට්ඨ කථා*, සංස්. ධම්මකිත්ති සිරි ධම්මානන්ද හිමි, සයිමන් හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණාලය, පළමු භාගය, කොළඹ, 1933. 1 පි.
69. Cunningham, op.cit, 1966, 189, 191, 203 - 225, 31 – 33 pp.
70. Cunningham, Op.cit, 1966, 145-148pp.; J. Marshall, and Alfred

Fourche, The Monuments of sanchi, Vol. I-
II, Delhi: Swati Publication, 1983, 80-85 චචත ධීරානන්ද හිමි, එම, 2005, 53-55 පිටු.

71. උෟපූම, පරි. 12, 9-28 ගාථා ; සමන්ත, 29 පි.
72. *The earliest Buddhist Shrine: Excacavating the Birthplace of the Buddha*, Lumbini (Nepal) , R.A.E. Coningham, K.P. Acharya, K.M. Strickland, C.E. Davis and others, Antiquity, Volume 87, pp. 1104- 1124, (December 2013).
73. සිරිසමන් විජේතුංග, *සිදුහත් කුමරු උපන් ලුම්බිණියේ මායාදේවී විහාරය*, නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ, 2019, 87 පි.
74. B. K. Rijal, *Archaeological Remain s of Kapilavastu Lumbini and Devdah*a, Nepal, 1979, 15 -17 pp.